of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of



**2.ඒකකය -** ප්‍රාසංගික කලා හඳුනාගනිමු .

**ප්‍රාසාංගික කලාවක් යනු,**

ගායනය ,රංගනය, චලනය, පදනම් කරගෙන ශිල්පියාගේ පෞරුෂය මැනවින් හසුරුවා ගනිමින් ප්‍රේක්ෂක පිරිසක් ඉදිරියේ රංග භූමියක සජීවීව ඉදිරිපත් කරනු ලබන නිරූපණ කලාව ප්‍රාසාංගික කලාව ලෙස හැඳින්වේ .

**ප්‍රාසාංගික කලා**

ප්‍රාසාංගික කලාවේ මූලික ප්‍රභේද තුනකි.

- සංගීතය
- නර්තනය
- නාට්‍ය

මීට අමතරව ඔපෙරා ,බැලේ, මුද්‍රා නාට්‍ය ගීත නාට්‍ය ,රූකඩ,අභිරූපනය ප්‍රාසාංගික කලා ගත් යටතට ගැනේ .

**ප්‍රාසාංගික කලාවක් ලෙස සංගීතය,**

සංගීත ප්‍රසංගයක් ඒකල,යුගල හෝ සාමූහික වශයෙන් සජීවී ලෙස වේදිකාවක ඉදිරිපත් කෙරේ .ශබ්ද විකාශන යන්ත්‍ර හා ශබ්ද පරිපාලනය මෙහිදී වැදගත්වන අතර වේදිකා සැරසිලි හා රංගාලෝකය එහි ප්‍රසංගාත්මක ස්වරූපය තීව්‍ර කරයි.ප්‍රධාන මාධ්‍යය වන්නේ නාදයයි.

**ප්‍රාසාංගික කලාවක් ලෙස නර්තනය ,**

නර්තන කලාව ඉදිරිපත් කිරීමේ කිරීමේදී ආංගික අභිනය ප්‍රධාන වේ .සජීවී කලා මාධ්‍යයකි.විවිධ භූ හැඩතල අවකාශමය හැඩතල සමුච්චය කින් නිර්මාණය වී ගොඩනැගෙන කලාවකි.තාල වාද්‍ය වාද්‍ය භාණ්ඩ සංගීතය සඳහා යොදා ගනී.

**ප්‍රාසාංගික කලාවක් ලෙස මුද්‍රා නාට්‍ය ,**

සජීවී කලා මාධ්‍යකි .සංගීතයට අනුව නර්තනය හා ප්‍රකාශනාත්මක චලන යොදා ගනිමින් කතා පුවතක් කතාපුවතක් ඉදිරිපත් කරයි.නර්තන ශිල්පීන් විසින් රූපණය ඉදිරිපත් කරයි.වාචික අභිනය භාවිතා නොකරයි .සංගීතය හා රංගාලෝකය ඉතා වැදගත් වේ .වේදිකා සැරසිලි අත්‍යවශ්‍ය නොවේ .

**ප්‍රාසාංගික කලාවක් ලෙස ඔපෙරාව,**

සජීව කලාවකි වේදිකා සැරසිලි අත්‍යවශ්‍ය නොවේ.ගායනයට වැදගත් තැනක් හිමිවේ සංගීතය යොදා ගනිමින් කතාවක් හෝ සිද්ධියක් නිරූපණය කරනු ලබයි.මෙහිදීද වේදිකා සැරසිලි අත්‍යවශ්‍ය නොවේ .

**ප්‍රාසාංගික කලාවක් ලෙස රූකඩ සංදර්ශන ,**

රූකඩ යන රූප කඩක් නැතහොත් යම් කෘතිම රූප සංකේතයක් භාවිත කරමින් කතාවක් ඉදිරිපත් කිරීමයි රූකඩය නළුවෙකු සේ පෙනී සිටින අතර සැබවී සිට එය ක්‍රියාකරවන්නා එම රූපයට ආත්මය ලබා දෙයි.

**ප්‍රාසාංගික කලාවක් ලෙස නාට්‍ය ,**

සජීවී කලාවකි.සතර අභිනයම යොදා ගනී .නළුවා හා ප්‍රේක්ෂක සා සම්බන්ධය ඉතා වැදගත් වේ.කතා වස්තුවට ප්‍රබල ස්ථානයක් හිමිවේ.ආකෘතිය ශෛලිය හා තේමාව අනුව නාට්‍ය ප්‍රභේද වෙනස් වේ.

- **ප්‍රාසාංගික කලාවේ ලක්ෂණ ,**

  **සජීවී බව**

  **ප්‍රේක්ෂක සහභාගිත්වය**

  **සතර අභින භාවිතය**

  **සජීවී ප්‍රේක්ෂක පිරිසක් අභිමුඛයෙහි ඉදිරිපත් කිරීම**

  **මනා ප්‍රාසාංගිකත්වය කින් යුක්ත වීම.**

  **රංග භූමියක් භාවිතය(තාවකාලිකව හෝ නිශ්චිත )**

  තම මාධ්‍යයට අදාල ශිල්ප ධර්ම ශික්ෂණයකින් හා අපූර්වත්වයකින් **යුතුව ඉදිරිපත් කිරීම.**

**පැවරුම් -**

- ප්‍රාසංගික කලාවන් පිළිබඳ වීඩියෝ පට නරඹා තවදුරටත්පාඩම පිළිබඳ අධ්‍යයනයක යෙදෙන්න .
- [https://youtu.be/HhI4zkqpO_M](https://youtu.be/HhI4zkqpO_M) මෙම වීඩියෝ පාඩම නරඹන්න

**https://www.youtube.com/watch?v=QQG4uHoI_zs&t=56s**

**https://www.youtube.com/watch?v=ueNn7FyUcJw&t=102s**